# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/7/1/1-6 | ඔබේ අංකය / உனது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.05.24 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2022**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ
ගණන් දීමේ නිලධාරීන්

**<u>ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා වන ඉංජිනේරුමය යෝජනා ක්‍රියාත්මක කිරීම</u>**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරත වන කොන්ත්‍රාත්කරුවන් විසින් වර්තමානය වන විට මුහුණ පා ඇති ගැටළු නිරාකරණය කිරීම සඳහා, දැනට ක්‍රියාත්මක වන චක්‍රලේඛ උපදෙස් හා මාර්ගෝපදේශ යළි සවි බල ගැන්වීම සහ කොන්ත්‍රාත්කරුවන්ට මුහුණ පෑමට සිදු වී ඇති ඇතැම් ප්‍රායෝගික තත්ත්වයන් සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) විසින් ඉදිරිපත් කරන ලද ඉංජිනේරුමය යෝජනා පිළිබඳව සලකා බලා ඒ පිළිබඳව වූ මාගේ නිර්දේශයන් සඳහා ලද ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. මෙහි පහත දැක්වෙන පරිදි එකී තීරණ 2022.05.19 දින සිට ක්‍රියාත්මක කළ යුතු බව මෙමඟින් දැනුම් දෙමි.

| ගැටළුව/ පවත්නා තත්ත්වය | බලපාන සීමාවන් | චක්‍රලේඛය/ පාදක වූ කරුණු | ඉංජිනේරුමය නිර්දේශය/ යෝජනාව | නිර්දේශය |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත් පැවරීමේ දී ඇස්තමේන්තුගත මුදල හා ලංසු මිල සම්බන්ධව<br><br>I. ඇස්තමේන්තු මුදලට වඩා ලංසු මිල ඉක්මවා යන අවස්ථාවල දී | දැනට බලපවත්වන චක්‍රලේඛ සීමාව පවත්වා ගැනීම. එනම්, ඇස්තමේන්තු මිලට වඩා 15%ක වැඩිවන අවස්ථාවල දී ලංසු ප්‍රතික්ෂේප කිරීම | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 හි 3.1 යටතේ වන v (ආ) වගන්තිය | බලපවත්වනු ලබන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම | රා.මු.ච.ලේ.03/2020 හි 3.1.v. ආ) වගන්තිය ප්‍රකාර ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු පිරිවැය විචලනයන් සහිත බැහැරවීම් කිහිපයක් ඇති අවස්ථාවක අදාළ ටෙන්ඩරය සම්බන්ධයෙන් ඉහත ක්‍රියාමාර්ගයන්ට එළඹීමට පෙර එකී ඉංජිනේරු ඇස්තමේන්තුව නැවත සලකා බැලීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් ගත යුතු ය. |


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 4944002 කාර්යාලය / காரியாலயம் / Office } 091 4119011, 091 2226118 ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299 විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefsec1@sltnet.lk වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එච්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

| | | | | |
|---|---|---|---|---|
| II. ඇස්තමේන්තු මුදලට වඩා ලංසු මිල අවම වන අවස්ථාවල දී | (අ) ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 11% සිට 19% දක්වා අඩු වන අවස්ථාවල දී කාර්ය සාධන සුරක්ෂණය 5%කින් වැඩි කළ යුතු ය. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 (I) | බලපවත්වනු ලබන චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම | දැනට බලපවත්වනු ලබන චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කිරීම |
| | (ආ) ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 20% සිට 29% දක්වා අඩු වන අවස්ථාවල දී කාර්ය සාධන සුරක්ෂණය 10%කින් වැඩි කළ යුතු ය. | -එම- | -එම- | දැනට බලපවත්වනු ලබන චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කිරීම |
| | (ඇ) ලංසු මිල ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා 30% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් අඩු වන අවස්ථාවල දී එම ලංසුව ප්‍රතික්ෂේප කළ යුතු ය. | -එම- | -එම- | දැනට බලපවත්වනු ලබන චක්‍රලේඛයේ සඳහන් පරිදි කටයුතු කිරීම |
| පවත්නා වෙළෙඳ පොළ තත්ත්වයට මුහුණ දීම සඳහා මිල කමිටු රැස්වීම් පැවැත්වීමේ වාර ගණන ප්‍රමාණවත් නොවීම | මසකට එක් වරක් මිල කමිටු රැස්වීම් පැවැත්වීම | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක HA/ED/Districts PROJECTS දරන 2022.03.21 දිනැති ලිපිය | මසකට වරක් මිල කමිටු රැස්වීම් පැවැත්වීම | මිල විචලතාවන් පාලනය කළ නොහැකි ලෙස උච්චාවචනය (වැඩිවීම්) වන කාල සීමාවල දී පමණක් වන සේ මිල කමිටු රැස්වීම් පැවැත්වීම |
| වැඩි වටිනාකමකින් හා වැඩි කොන්ත්‍රාත් කාලසීමාවකින් යුතු කොන්ත්‍රාත් පැවරීමේ දී CIDA මාර්ගෝපදේශය පාදක කරගෙන ගෙවීම් කළ හැකි විචලන සීමාව අවිනිශ්චිත තත්ත්වයකට පත් වන බැවින් මෙවැනි කොන්ත්‍රාත්තු කළමනාකරණය කර ගැනීමේ ගැටලුව | කරන ලද වැඩවල වටිනාකමේ මිල විචලනය මුළු පිරිවැය ඇස්තමේන්තු තුළ හෝ ගෙවීම සඳහා ප්‍රමාණවත් නොවීම | 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | - | 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ ඡේද අංක 03.i, ii සහ iii අනුව කටයුතු කිරීම නිර්දේශ කරමි. |
| දීර්ඝ කාලයක් ගතව ඇති බොහෝ වැඩ අවසන් නොවූ කොන්ත්‍රාත් පිළිබඳ ගැටලු | - | - | දෙපාර්ශවයේ එකඟතාවය මත හෝ බලපවත්නා CIDA නිර්ණායක මත අවලංගු කිරීම හා නව මිල ගණන් පාදක කරගෙන ඇස්තමේන්තු අනුව කොන්ත්‍රාත් පැවරීම | 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ ඡේද අංක 03.i, ii සහ iii අනුව කටයුතු කිරීම නිර්දේශ කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| වලංගු කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකිරීමේ ගැටලුව<br><br>කොන්ත්‍රාත්කරුවන්ගේ සාධාරණ ඉල්ලීම් අනුව රට තුළ පවත්නා භාණ්ඩ හිගය, ඩොලර් පිළිබඳ ගැටලුව වැනි ආර්ථික අර්බුදකාරී තත්ත්ව මත පදනම් වූ පොදු කරුණු අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම පිළිබඳ සලකා නොබැලීම | - | - | කොන්ත්‍රාත්කරුවන්ගේ පාලනයෙන් බැහැරව පැන නැඟෙන තත්ත්ව සහ පැවතිය හැකි ආර්ථිකමය තත්ත්ව පදනම් කරගෙන පොදු නිර්ණායකයන් යටතේ දින දීර්ඝ කිරීම් ලබා දී එම කාලපරිච්ඡේදය කොන්ත්‍රාත්තුවේ වලංගු කාලය ලෙස සලකා අදාළ මිල වැඩි වීම් ලබා දීම | කොන්ත්‍රාත්කරුවන්ගේ පාලනයෙන් බැහැර කාර්යයන් සඳහා ඉංජිනේරුමය නිර්දේශයන් මත ලබා දෙන දින දීර්ඝ කිරීම්වල දී එම කාලපරිච්ඡේදය වලංගු ලෙස සලකා මිල වැඩි වීම් ලබා දීම |
| රේටයන් සම්බන්ධ ගැටලු | - | - | - | ඇස්තමේන්තු සකසන අවස්ථාවේ දී හැකි සෑම විටෙකම ආසන්න මිල කමිටු රේටයන් අනුව ඇස්තමේන්තු සැකසීම හා ජාතික තරගකාරී ලංසු කැඳවීම (NCB) ප්‍රසම්පාදන ක්‍රමයේ දී ලංසුකරුවන් විසින් ඇස්තමේන්තු රේටයන් ඉක්මවා ලංසු ඉදිරිපත් කර ඇත්නම් ඇගැයීම් කිරීමේ දී ඇගැයීම සිදු කරන අවස්ථාවට ආසන්නතම මිල කමිටු රේටයන් අනුව ඇගැයීම් කිරීම |
| ඉදිකිරීම් කොන්ත්‍රාත් පැවරීමේ දී CIDA නිර්ණායකයන්ට අනුව කොන්ත්‍රාත් කාලය ලබා නොදීම | - | - | - | කොන්ත්‍රාත් කාලය CIDA නිර්ණායකයන්ට අනුව ලබා දීමට ක්‍රියා කිරීම හා යම් විශේෂිත තත්ත්වයන් යටතේ කොන්ත්‍රාත්කරුගේ එකඟවීම මත ඉංජිනේරු නිර්දේශය මත පදනම්ව අඩු කළ කාලසීමාවන් සඳහා කොන්ත්‍රාත් පැවරීමට ක්‍රියා කිරීම |

04. ඒ අනුව, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020, 03/2020 (i) හා ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ඇතුළු චක්‍රලේඛවල සඳහන් කරුණු සම්බන්ධයෙන් වූ මාගේ නිර්දේශ එකී චක්‍රලේඛ ප්‍රකාර ක්‍රියාත්මක කිරීමත්, මාගේ අනෙකුත් නිර්දේශ පිළිබඳව සුවිශේෂීව සැලකිළිමත් වෙමින් පිළිගත හැකි සාක්ෂි මත පදනම්ව අදාළ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු බවත් මෙයින් කාරුණිකව දන්වමි.

ආර්.සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, ගාල්ල. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.